ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 නොවැම්බර් මස 27 වැනි දින |

## 2017 සැප්තැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

අඛණ්ඩව තෙවන මාසයට ද එ.ජ. ඩොලර් බිලියනයක සීමාව පසු කරමින්, 2017 වසරේ සැප්තැම්බර් මාසයේ දී අපනයන අංක දෙකක අගයකින් වර්ධනය වී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි දායක විය. කෙසේ වුවත්, මාසය තුළ දී ඉන්ධන සහ සහල් ආනයන ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් විය. 2016 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව සංචාරකයන් පැමිණෙන ප්‍රධාන රටවලින් පැමිණි සංචාරකයන් ප්‍රමාණය සුළු වශයෙන් පහළ යෑමත් සමඟ මාසය තුළ දී සංචාරක ඉපැයීම් ද සුළු වශයෙන් අඩු විය. සැප්තැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව අඩු වූ අතර, එය 2017 වසරේ පළමු මාස නවය තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කැපී පෙනෙන ලෙස අඩු වීම සඳහා හේතු විය. කෙසේ වුව ද, අඛණ්ඩ ආයෝජක විශ්වාසය පිළිබිඹු කරමින් කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ ඉහළ විදේශීය ලැබීම් සමඟ මාසය තුළ දී ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම අඛණ්ඩව ශක්තිමත් විය. ඒ අනුව, 2017 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය එ.ජ. ඩොලර් බිලියන 2.0 ක අතිරික්තයක් වාර්තා කළේය. මේ අතර, 2016 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 6.0 සිට 2017 වසරේ සැප්තැම්බර් අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 7.3 දක්වා ඉහළ ගියේය.

### සංඛ්‍යා සටහන 1 : විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | 2017 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන.-සැප්. (එ.ජ.ඩො මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 898 | 1,011 | 12.6 | 7,786 | 8,424 | 8.2 |
| ආනයන | 1,508 (ආ) | 1,667 | 10.5 | 13,911 (ආ) | 15,264 | 9.7 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -610 (ආ) | -656 | - | -6,125 (ආ) | -6,840 | - |
| සංචාරක ඉපැයීම් | 255 | 249 (ඇ) | -2.3 | 2,588 | 2,663 (ඇ) | 2.9 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 578 | 481 | -16.7 | 5,382 | 4,985 | -7.4 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 5 | -62 | -1,329.3 | -19 | 266 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් | 609 (ආ) | 298 | -51.1 | 4,282 (ආ) | 4,717 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 125 | 187 | 50.3 | 1,161 | 1,261 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 1,500 | 1,500 | |
| දිගු කාලීන ණය | 84 (ආ) | 111 | 32.1 | 921 (ආ) | 956 | |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | 400 | - | - | 700 | 1,000 | |
| ජා.මු. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම | - | - | - | 168 | 167 | |
| විදේශ ඍජු ආයෝජන (ඉ) | - | - | - | 293 | 711 | |
| සමස්ත ශේෂය | - | - | - | 243 | 2,027 | |


**මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැක.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි ඍජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ඍජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ හිඟය

පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 සැප්තැම්බර් මාසයේ දී වෙළඳ හිඟය පුළුල් වූ අතර, 2017 වසරේ පළමු මාස නවය තුළ දී ද වෙළඳ හිඟය පුළුල් විය. රට තුළ පැවති නියං තත්ත්වය හේතුවෙන් අතිරේක ආනයන වියදමක් දැරීමට සිදු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**රූප සටහන 1 : මාසික වෙළඳ ශේෂය**





**මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

**අපනයන ක්‍රියාකාරිත්වය**

2017 මාර්තු මාසයේ සිට පැවති අපනයන වර්ධනය වීමේ ප්‍රවණතාව 2017 සැප්තැම්බර් මාසයේදී ද අඛණ්ඩව පැවතිණි. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා වෙළඳපොළ වෙත සිදු කරන ලද ඇඟලුම් අපනයන වර්ධනය වීම හේතුවෙන් රෙදිපිළි හා ඇඟලුම් අපනයන ඉහළ යෑම නිසා කාර්මික අපනයන ආදායම ඉහළ යෑම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. තවද, නැව් සහ ගුවන්යානා සඳහා භාවිත කරන ඉන්ධනවල අපනයන පරිමාව හා අපනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මීට අමතරව, රබර් ටයර් සහ ශල්‍යාගාරවල යොදා ගැනෙන අත්වැසුම් හා වෙනත් අත්වැසුම්වල අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. මේ අතර, 2017 වසරේ ආරම්භයේ සිට වර්ධනය වූ කෘෂිකාර්මික අපනයන ආදායම 2017 සැප්තැම්බර් මාසයේදී ද අඛණ්ඩව ඉහළ ගියේය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි තේ මිල ගණන් ඉහළ යෑම සහ තේ අපනයන පරිමාව සුළු වශයෙන් වර්ධනය වීම හේතුවෙන් තේ අපනයනවල ක්‍රියාකාරිත්වය ඉහළ යෑම මේ සඳහා හේතු විය. ගම්මිරිස්, කරාබු නැටි සහ කුරුඳු අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ මුහුදු ආහාර අපනයන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 153කින් වර්ධනය වෙමින් මුහුදු ආහාර අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, යුරෝපා වෙළඳපොළ වෙත මුහුදු ආහාර අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීම සහ විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස් පහසුකම) නැවත ප්‍රතිස්ථාපනය වීමේ යහපත් බලපෑම ඉන් පිළිබිඹු විය. කෙසේ වුවද, 2016 සැප්තැම්බර් මාසයේ දී සිංගප්පූරුව වෙත මගී නෞකාවක් අපනයනය කිරීම නිසා

**රූප සටහන 2 : මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

එම මාසයේ පැවති ඉහළ අපනයන ආදායමේ බලපෑම පිළිබිඹු කරමින් 2017 සැප්තැම්බර් මාසයේ දී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහළ ගියේය. 2017 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ඉතාලිය සහ ජර්මනිය පැවති අතර, එම රටවල් වෙත සිදු කළ අපනයන මුළු අපනයනවලින් සියයට 51 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 2 : අපනයන ආදායම (අ)**


| කාණ්ඩය | 2016 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-සැප් (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජන-සැප් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **669.9** | **744.5** | **11.1** | **6,007.5** | **6,306.8** | **5.0** |
| රෙදිපිළි හා ඇඟලුම් | 382.2 | 431.5 | 12.9 | 3,715.8 | 3,715.0 | (0.0) |
| එයින්, ඇඟලුම් | 358.8 | 407.3 | 13.5 | 3,513.9 | 3,495.4 | (0.5) |
| රබර් නිෂ්පාදිත | 67.5 | 76.5 | 13.3 | 575.9 | 614.6 | 6.7 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 19.0 | 40.2 | 111.1 | 204.4 | 292.8 | 43.3 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 30.7 | 37.2 | 21.2 | 253.1 | 296.3 | 17.1 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 29.2 | 35.3 | 21.0 | 229.4 | 277.4 | 20.9 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 23.3 | 21.5 | (7.4) | 210.6 | 188.2 | (10.6) |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 14.2 | 13.4 | (5.4) | 129.9 | 120.4 | (7.3) |
| ප්‍රවාහන උපකරණ | 31.1 | 6.6 | (78.7) | 112.0 | 144.8 | 29.2 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 3.6 | 3.1 | (13.8) | 26.3 | 25.2 | (4.5) |
| වෙනත් | 69.1 | 79.1 | 14.4 | 549.9 | 632.1 | 14.9 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **224.0** | **262.7** | **17.3** | **1,744.6** | **2,077.8** | **19.1** |
| තේ | 114.9 | 136.9 | 19.2 | 949.9 | 1,139.6 | 20.0 |
| කුළුබඩු | 39.9 | 48.9 | 22.5 | 234.0 | 297.5 | 27.1 |
| පොල් | 37.2 | 33.0 | (11.2) | 275.5 | 273.1 | (0.9) |
| මුහුදු ආහාර | 12.3 | 20.8 | 68.5 | 123.0 | 176.2 | 43.2 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 10.5 | 14.3 | 36.6 | 93.9 | 110.9 | 18.1 |
| සකස් නොකළ දුම්කොළ | 4.4 | 3.2 | (26.7) | 24.3 | 26.7 | 9.9 |
| රබර් | 2.3 | 2.9 | 28.8 | 23.1 | 31.6 | 36.6 |
| එළවළු | 2.6 | 2.7 | 4.9 | 20.8 | 22.1 | 6.4 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **4.1** | **3.8** | **(6.0)** | **34.0** | **39.6** | **16.6** |
| **මුළු අපනයන** | **897.9** | **1,011.0** | **12.6** | **7,786.0** | **8,424.1** | **8.2** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

**ආනයන ක්‍රියාකාරිත්වය**

**රූප සටහන 3 : මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

2017 සැප්තැම්බර් මාසයේ දී ආනයන වියදම අඛණ්ඩව තෙවැනි මාසයටත් අංක දෙකකින් යුත් වර්ධනයක් වාර්තා කළ අතර, විශේෂයෙන්ම ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම නිසා අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිල ගණන් ඉහළ යෑම සහ තාප විදුලිබල උත්පාදනය සඳහා ඉහළ ඉන්ධන පරිමාවක් ආනයනය කිරීම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. තවද, ඉදිකිරීම් අංශයෙන් වූ ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින් යකඩ හා වානේ මූලික කරගත් මූල ලෝහ, සිමෙන්ති ක්ලින්කර මූලික කරගත් ඛනිජ නිෂ්පාදිත සහ සිමෙන්ති මූලික කරගත් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, සීනි ආනයන පරිමා සහ ආනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. කෙසේ වුවද, දේශීය වෙළඳපොළ තුළ පවතින සහල් හිඟය සපුරාලීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2016 වසරේ සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ ආනයනය කරනු ලැබූ සහල් මෙට්‍රික් ටොන් 21,457 හා සැසඳීමේ දී 2017 වසරේ මේ දක්වා කාලය තුළ දී සහල් මෙට්‍රික් ටොන් 497,889ක් පමණ ආනයනය කිරීම හේතුවෙන් 2017 සැප්තැම්බර් මාසයේදී ද සහල් ආනයන වියදම අඛණ්ඩව ඉහළ ගියේය. 2017 සැප්තැම්බර් මාසය තුළ ඉන්දියාව, චීනය, සිංගප්පූරුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ජපානය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස පැවති අතර, එම රටවල් වෙතින් සිදු කළ ආනයන මුළු ආනයනවලින් සියයට 58ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 3 : ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2016 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 සැප්තැම්බර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **374.8** | **328.9** | **(12.2)** | **3,199.7** | **3,279.0** | **2.5** |
| ආහාර හා පාන වර්ග | 144.8 | 131.2 | (9.4) | 1,183.9 | 1,335.7 | 12.8 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.8 | 23.1 | 1,186.3 | 15.4 | 208.0 | 1,248.9 |
| එයින්, සහල් | 1.4 | 22.0 | 1,492.8 | 8.6 | 198.4 | 2,209.2 |
| එළවළු | 28.6 | 28.0 | (2.1) | 280.3 | 263.6 | (5.9) |
| කිරි නිෂ්පාදිත | 18.6 | 23.5 | 26.5 | 175.7 | 226.4 | 28.9 |
| මුහුදු ආහාර | 20.3 | 18.3 | (9.8) | 179.6 | 166.1 | (7.5) |
| සීනි හා රසකැවිලි | 38.7 | 10.7 | (72.3) | 234.6 | 199.5 | (15.0) |
| පලතුරු | 6.6 | 7.1 | 8.3 | 52.3 | 62.1 | 18.7 |
| කුළුබඩු | 11.8 | 5.9 | (50.0) | 102.2 | 70.3 | (31.2) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 18.4 | 14.6 | (21.1) | 143.8 | 139.7 | (2.9) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 230.0 | 197.7 | (14.0) | 2,015.8 | 1,943.3 | (3.6) |
| රථවාහන | 60.8 | 55.4 | (8.9) | 607.9 | 560.4 | (7.8) |
| විදුලි සන්දේශ උපකරණ | 21.0 | 22.4 | 6.3 | 172.8 | 197.4 | 14.2 |
| රෙදිපිළි හා උපාංග | 44.4 | 22.2 | (50.1) | 287.6 | 284.5 | (1.1) |
| මුද්‍රිත ද්‍රව්‍ය හා ලිපි ද්‍රව්‍ය | 3.4 | 4.8 | 43.1 | 28.4 | 28.6 | 0.7 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 100.4 | 93.0 | (7.4) | 919.1 | 872.5 | (5.1) |
| **2. අන්තර් භාණ්ඩ** | **775.6** | **949.4** | **22.4** | **7,084.6** | **8,221.2** | **16.0** |
| ඉන්ධන | 176.3 | 298.5 | 69.3 | 1,677.2 | 2,451.3 | 46.2 |
| එයින්, බොරතෙල් | 34.3 | 79.9 | 133.0 | 404.4 | 471.0 | 16.5 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 132.2 | 218.4 | 65.2 | 1,163.0 | 1,806.1 | 55.3 |
| ගල්අඟුරු | 9.9 | 0.3 | (97.4) | 109.7 | 174.2 | 58.8 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 44.4 | 40.2 | (9.4) | 343.7 | 514.8 | 49.8 |
| එයින්, රත්‍රන් | 33.0 | 32.0 | (3.1) | 244.3 | 434.7 | 78.0 |
| මූල ලෝහ | 40.3 | 66.2 | 64.0 | 289.8 | 419.2 | 44.6 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 221.5 | 217.3 | (1.9) | 1,986.2 | 1,998.5 | 0.6 |
| රසායනික නිෂ්පාදිත | 60.2 | 63.4 | 5.3 | 628.2 | 613.3 | (2.4) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත උපාංග | 51.2 | 49.7 | (2.8) | 453.2 | 457.7 | 1.0 |
| රසායනික නිෂ්පාදිත | 12.3 | 23.6 | 91.4 | 169.1 | 145.2 | (14.1) |
| රබර් හා ඒ ආශ්‍රිත උපාංග | 18.1 | 23.2 | 28.5 | 211.5 | 216.3 | 2.3 |
| ආහාර සැකසුම් | 14.6 | 22.3 | 53.0 | 169.3 | 223.0 | 31.7 |
| පොහොර | 7.1 | 7.1 | 0.2 | 106.3 | 71.2 | (33.0) |
| වෙනත් | 129.5 | 137.9 | 6.5 | 1,050.1 | 1,110.7 | 5.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **357.5** | **385.9** | **7.9** | **3,617.1** | **3,623.6** | **0.2** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 194.7 | 203.5 | 4.5 | 2,010.1 | 1,941.8 | (3.4) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 111.3 | 122.9 | 10.5 | 1,137.0 | 1,177.7 | 3.6 |
| ප්‍රවාහන උපකරණ | 51.1 | 59.2 | 15.8 | 465.4 | 497.8 | 7.0 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.4 | 0.3 | (34.5) | 4.5 | 6.3 | 38.9 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.4** | **2.4** | **574.0** | **9.8** | **139.9** | **1,329.9** |
| **මුළු ආනයන** | **1,508.3** | **1,666.7** | **10.5** | **13,911.1** | **15,263.7** | **9.7** |


**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

### ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්


සංචාරක පැමිණීම් අඩු වීම හේතුවෙන් 2016 සැප්තැම්බර් මාසය හා සැසඳීමේ දී 2017 සැප්තැම්බර් මාසයේ දී සංචාරක ඉපැයීම් අඩු වීමක් වාර්තා කළේය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ චීනය, මාලදිවයින, ජර්මනිය සහ රුසියාව යන රටවලින් පැමිණි සංචාරක සංඛ්‍යාව අඩු වීමයි. කෙසේ වුව ද, 2017 වසරේ පළමු මාස නවය තුළ දී සමුච්චිත සංචාරක පැමිණීම් සහ සමුච්චිත සංචාරක ඉපැයීම්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී වර්ධනය විය. මේ අතර, මැද පෙරදිග කලාපයේ ආර්ථික ක්‍රියාකාරකම්වල මන්දගාමී වර්ධනය සහ අහිතකර භූ-දේශපාලනික තත්ත්ව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කෙරෙහි තවදුරටත් අහිතකර බලපෑමක් ඇති කළේය. එබැවින්, 2017 සැප්තැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස අඩු විය. එම ප්‍රවණතාවට අනුව යමින්, 2017 වසරේ පළමු මාස නවය තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම් ද, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී අඩු වීමක් වාර්තා කළේය.

**රූප සටහන 4 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර පහ**




**මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**රූප සටහන 5 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව**

### මූල්‍ය ලැබීම්


ජංගම ගිණුමෙහි අපේක්ෂිත මට්ටමට වඩා අඩු වර්ධනය හමුවේ වුව ද, අඛණ්ඩ විදේශ මූල්‍ය ලැබීම් හේතුවෙන් සැප්තැම්බර් මාසයේ දී ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම ශක්තිමත් විය. 2017 මාර්තු මාසයේ සිට පැවති ධනාත්මක ප්‍රවණතාව තවදුරටත් පවත්වා ගනිමින් අඛණ්ඩව හත් වැනි මාසයට ද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ

විදේශීය ආයෝජන ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එමගින් ආයෝජකයන්ගේ ධනාත්මක ආකල්ප පිළිබිඹු කෙරිණි. මීට අමතරව, වසරේ පළමු මාස නවය තුළ දී, රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය, ශුද්ධ පදනම මත වර්ධනය විය. මේ අතර, සැප්තැම්බර් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන ශුද්ධ ගෙවීමක් (ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ විදේශ විනිමය ප්‍රවාහ ඇතුළුව) වාර්තා කළ අතර, ශ්‍රී ලංකාවේ සමූහ සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් සමාගමක විදේශ හිමිකම අත්පත් කර ගැනීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, 2017 වසරේ පළමු මාස නවය තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ සමුච්චිත විදේශීය ආයෝජන 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වූ ශුද්ධ ගෙවීමට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

**ජාත්‍යන්තර සංචිත**

2017 සැප්තැම්බර් මස අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.2 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් දක්වා වර්ධනය විය. මේ අතර, බැංකු අංශයේ විදේශ වත්කම් ඇතුළත් මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.6 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 9.6 ක් විය.

**රූප සටහන 6 : දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**





**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

**විනිමය අනුපාතිකයේ හැසිරීම**

ශ්‍රී ලංකා රුපියල 2017 නොවැම්බර් 24 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.5 කින් මධ්‍යස්ථ ලෙස අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අවප්‍රමාණය විය.

**රූප සටහන 7 : එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 : අනෙකුත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2017 නොවැම්බර් මස 24 දක්වා අධිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|
| එ.ජ. ඩොලර් | -2.5% |
| යුරෝ | -13.3% |
| ස්ටර්ලින් පවුම් | -10.0% |
| ජපන් යෙන් | -6.8% |
| කැනේඩියානු ඩොලරය | -8.0% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.5% |
| ඉන්දියානු රුපියල | -7.3% |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව